# ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හා ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

**ඒ. ඒ. පී. එම්. මධුභාෂිණී**[1]

**සංක්ෂේපය**

මෑත කාලීන ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයට පමණක් දෙවන භෞතික පහසුකම්වලින් යුතු දෙවන පරිපාලන නගරය ලෙස ගම්පහ දිස්ත්‍රික්කයට වැඩි අවධානයක් යොමු වී තිබේ. අර්ධ වාණිජමය දිස්ත්‍රික්කයක් ලෙසත්, ස්වභාව සෞන්දර්යයෙන්, කෘෂි කර්මාන්තයෙන් ස්වයං පෝෂිත සංචාරක පුරවරයක් ලෙසත් ගම්පහ දිස්ත්‍රික්කය නම් කළ හැකිය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධන අවශ්‍යතා හා ගැටලු හඳුනා ගැනීමයි. ද්විතීයික දත්ත මූලාශ්‍ර යොදාගනිමින් මෙම අධ්‍යනය සිදු කර තිබේ. මෙම මාතෘකාවට අදාළව රචිත පොත්, සඟරා ලිපි, විවිධ වාර්ෂික වාර්තා මෙන්ම අන්තර්ජාලය ඇසුරින් ද අවශ්‍ය තොරතුරු මූලාශ්‍ර ලබා ගන්නා ලදී. දත්ත විශ්ලේෂණ සඳහා විස්තරාත්මක සංඛ්‍යාන ශිල්ප ක්‍රම අතරින් සහසම්බන්ධතාවය, ප්‍රතිපායනය යනාදී සංඛ්‍යානමය ශිල්ප ක්‍රම යොදාගෙන තිබේ. දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනයේ වර්ධනයක් දක්නට ලැබෙන අතර වයස්ගත ජනගහනයේ ඉහළ යාමක් දක්නට ලැබුණි. නමුත් ජනගහනයේ වර්ධනයට සාපේක්ෂව ප්‍රවාහනය හා මහාමාර්ග, අධ්‍යාපනය සෞඛ්‍යය, සන්නිවේදන තාක්ෂණය, බලශක්තිය හා ඛනිජ තෙල්, නිවාස හා සනීපාරක්ෂාව, ජල සම්පාදනය වැනි ක්ෂේත්‍ර ජනගහනයට සාපේක්ෂව වර්ධනය වී නොමැත. ගෘහ කාණ්ඩ 604009 කින් 170762 ක ප්‍රමාණයක් පමණක් නළ ජලය පරිහරණය කරයි. තවමත් භූමිතෙල් භාවිතයෙන් ආලෝකය ලබාගන්නා පවුල් 21927 ක් සිටී. 2014 වර්ෂයේ මාතෘ මරණ 15ක් වාර්තා වී තිබේ. සංවර්ධනය උදෙසා විවිධ කාලවලදී විවිධ ව්‍යාපෘති හඳුන්වා දී තිබුණත් ඇතැම් ව්‍යාපෘති අසාර්ථක වී තිබේ. ඇතැම් ඒවායේ ක්‍රියාකාරීත්වය අකාර්යක්ෂම මට්ටමේ පවතී. මේ නිසා එවැනි ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

**මුඛ්‍ය පද** : සංවර්ධන අවශ්‍යතා, ජනගහනය, ප්‍රතිපායනය, යටිතල පහසුකම්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, aapmm.piyumi@gmail.com